# මුල්කාලීන රූපවාහිනී කාටූන් වැඩසටහන්වලට සාපේක්ෂ ව සමකාලීන කාටූන් වැඩසටහන්වල සිංහල භාෂාවේ ගුණාත්මකභාවය සහ වත්මන් ළමා පරපුරේ භාෂා භාවිතය කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. සෙනාලි මධුෂිණී දිසානායක
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
senali23022000@gmail.com

**සාරසංක්ෂේපය**

රූපවාහිනිය වූ කලී වර්තමාන සන්නිවේදන මාධ්‍ය අතර ප්‍රමුඛ පෙළේ මාධ්‍යයකි. ඕනෑම පුද්ගලයෙකුට තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට රූපවාහිනී වැඩසටහන් මගින් හැකියාව ඇත. මේ අතුරින් කුඩා දරුවන්ට නිර්මාණය වූ කාටූන් වැඩසටහන්වලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. මන්ද කුඩා දරුවන්ගේ චර්යා රටාවන්, ආකල්ප සහ භාෂා භාවිතය ආදි සාධකවලට බලපෑමක් ඇති කිරීමට කාටූන්වලට හැකියාව පවතින බැවිනි. මෙම අධ්‍යයනයේ දී සමකාලීන කාටූන් වැඩසටහන්වල වචන මාලාව සහ භාෂාව හැසිරවීම ආදි භාෂාමය අන්තර්ගතය අධ්‍යයනය කිරීමත්, මුල්කාලීන රූපවාහිනී යුගයේ විකාශය වූ කාටූන් වැඩසටහන් සහ සමකාලීන කාටූන් වැඩසටහන්වල සිංහල භාෂාවේ ගුණාත්මකභාවය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක නිරත වීමත් සහ මුල් අවධියේ කාටූන්වලට සාපේක්ෂ ව සමකාලීන කාටූන්වලින් ළමා පරපුරේ භාෂා භාවිතයට හඳුනාගත හැකි බලපෑමක් සිදු වී තිබේ ද යන්න සොයා බැලීමත් අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවල විකාශය වන කාටූන් වැඩසටහන්වල නියැදියක් භාවිත කෙරෙන අතර නියැදුම් ක්‍රමය ලෙස පොකුරු නියැදීම භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස වයස අවුරුදු පහ-දහය අතර දරුවන් සිටින දෙමව්පියන් සහ දරුවන් සිය දෙනෙකුගේ නියැදියක් මගින් දත්ත රැස් කිරීමට අදහස් කරයි. පරීක්ෂණයේ නිරවද්‍යභාවය උදෙසා ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිත කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රශ්නාවලියකින් දෙමව්පියන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමට අදහස් කරන අතර සරල භාෂා ඇගයීම් ක්‍රම මගින් දරුවන්ගේ භාෂා ප්‍රවීණතාව සහ සන්නිවේදන කුසලතා පිළිබඳ දත්ත ලබා ගැනීමට බලාපොරොත්තු වේ. අනතුරුව, මෙම ක්‍රමද්වය ඔස්සේ ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණයට ලක් කර නිගමනයකට එළඹීමට අපේක්ෂා කෙරේ. එසේ ම ද්වීතියික දත්ත වශයෙන් මුල් රූපවාහිනී යුගයේ වැඩසටහන්වල භාෂා භාවිතය හා සම්බන්ධ පොත් පත්, සඟරා, ලිපි ගොනු සහ අන්තර්ජාලය මූලාශ්‍රය කරගනිමින් තොරතුරු ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අධ්‍යයනයෙන් භාෂා සංවර්ධනය කෙරෙහි රූපවාහිනී නාලිකාවල දායකත්වය පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇති අතර එසේ ම, සමකාලීන කාටූන් වැඩසටහන්වලින් දරුවන්ගේ භාෂා හැකියාවන්ට සිදුකරන බලපෑම පිළිබඳ ව ද නිවැරදි ව හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද -** භාෂා භාවිතය, මුල්කාලීන කාටූන්, ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය, සමකාලීන කාටූන්, සිංහල භාෂාවේ ගුණත්වය

# An Investigative Study on the Quality of Sinhala Language in Contemporary Cartoons Compared to Early Television Cartoons and Their Impact on Language Usage of the Current Generation of Children

D.M. Senali Madhushini Dissanayake
Department of Drama, Cinema and Television, University of Kelaniya
Senali23022000@gmail.com

## Abstract

Television serves as a prominent means of communication in contemporary society, with the capacity to transmit information to any person. Among them, cartoons designed for young children hold a unique position due to their potential to impact behavioural patterns, attitudes, and language usage in children. This investigative study aims to study the linguistic content such as vocabulary and language usage of contemporary cartoon programmes, to engage in a comparative analysis of the quality of Sinhala language in cartoon programmes telecasted in the early era and contemporary cartoon programmes, and to find out whether contemporary cartoons have had a detectable effect on the language use of children in comparison to early cartoons. To this, a sample of cartoon programmes aired on popular TV channels will be examined, utilising cluster sampling as the preferred sampling method. Primary data will be collected through a sample of parents who have children aged from 5-10 years and one hundred children. To ensure data accuracy, a stratified random sampling technique will be employed. Questionnaires will be utilised to gather responses from parents, while simple language assessments will be used to gather data on children's language proficiency and communication skills. Then, data gathered from these sources will be analysed to draw comprehensive conclusions. Additionally, secondary data will be gathered from relevant literature, including books, magazines, articles, and internet sources regarding language use in early television programmes. This study will provide a clear understanding of the contribution of television channels to language development, and it is also expected to accurately identify the impact of contemporary cartoon programmes on children's language abilities.

**Keywords:** Cluster Sampling, Contemporary Cartoons, Early Cartoons, Language Usage of Children, Quality Of Sinhala Language, Stratified Random Sampling Method